


# යන්න ගියා මැකිලා

"සද්භාවයෙන් යුතුව තමන්ගේ ප්‍රජාව වෙනුවෙන් යමක් කිරීමට ප්‍රබල ප්‍රතිරූපයක් මවා ගැනීසටම අවශ්‍ය නොවේ. තමන් කරනා දේ කුමක්ද යන්න පැහැදිලි කිරීමකට පමණක් සීමා නොවී නම හදා ගැනීමට කරනා අඬහැර එකී ප්‍රජාවේම අවඥාවට ලක්වීම පුදුමයට කාරණයක් නොවේ. සිතුවමකින් කියාපානා නිහඬ බවේ ගැඹර පරයන්නට අඬහැර පෑව ද නිහතමානීව කෙරෙනා සද්කාර්යයන් ප්‍රජාවගෙන් සඟවාලිය නොහේ" පන්හිඩ පූර්විකාවක් ලියනවා. පැන්සල බලාගත්ත අතේ බලාගෙන. පින්සල කොම්පියුටරේ පින්තූර වගයක් තෝරනවා.



"මාධ්‍යකරුවකුගේ පරම යුතුකම වන්නේත් වගකීම වන්නේත් තමාද යථාර්තයෙහි රැඳෙමින් අන් අයවද ඒ යථාර්ථයෙන් දැනුවත් කිරීමයි. යාවත්කාලීන කිරීමයි. මාධ්‍යකරුවකුගෙන් ප්‍රජාවක් බලාපොරොත්තුවන්නේ යථාර්ථය වෙනුවෙන් පෙනී සිටිමින් අසත්‍යය අසාධාරණය අවනීතිය හෙළා දැකීමයි"

"නිහඬව සද්භාවයෙන් යුතුව සත්‍ය වෙනුවෙන් පෙනී සිටිමින් සිය ප්‍රතිරූපය පිලිබඳව පයෙහි වැකුණ දූවිල්ලක් තරමටවත් නොතැකූ තවත් එක් තුරුණු නැවුම් සිතුවිලි සමුදායක් මැකී ගියේ ය. සිය ප්‍රජාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් පැය ගණන් ජංගම දුරකතනය රත් කළ හඬ පටිගත වූ හඬ පට කීපයකට සහ 3zzz ගුවන්විදුලි වෙබ් අඩවියට පමණක් ඉතිරි විය. ඒ නිහතමානී සුහද සිනහව කාජගත සේයාවන්ට පමණක් සීමා විය. මේ සියළු දේ තුළ සැග'වී ගත් ප්‍රාණය නිරුද්ධ විය. ඔහු ගියේ ය. සදහටම යන්න ගියේ ය."

"යන්න ගියා මැකිලා..." පන්ට ඉබේම කියවුණා.

"ජානක ගියේය. කලක් රෝගාතුරවී සිටි ජානක බාලසූරිය සොයුරාණන් වසර හතළිස් හතරක ආයු කාලයකින් සෑහීමකට පත්විය"

"පූර්විකා ලියූ සේම ජානක නිහඬව සද්භාවයෙන් කළ කී සිතූ පැතූ බොහෝ දේ අපගේ විප්‍රවාසී ප්‍රජාව වෙන්වෙන්ම විය. පවුලේ උදවිය පිලිබඳව සිතන්නට පතන්නට දේ ඔහු වෙත නොතිබුණා නොවේ. එහෙත් ඔහු සහෘදයින් සමග කතා කළ දේ අතර එවන් සිතුම් පැතුම් මුහුවූවා නම් ඒ ඉතා අල්ප වශයෙනි"

"විනාඩි හත අටක වැඩිම වුණොත් විනාඩි දහයක "මෙපුර රසහව්" 3zzz සිංහල ගුවන් විදුලි අංශය පිලිබඳව පැයකට වඩා කතා කිරීමට ජානකට කරුණු තිබුණි. පසුගිය දේ විමසන්නා සේම ඉදිරිය සැළසුම් කිරීමත් ගුණ මෙන්ම දොස් ද පැහැදිලි කිරීමත් ඒ අතරට එක්විය. එය එසේ කිරීමට ජානකට හොඳ පරිචයක් කියැවීමක් තිබිණ. ඒ කියැවීම හුදෙක් පාණ්ඩිත්‍යයේ ඕජාව උතුරා ගලන පොත් ගුල්ලන්ගේ බහුශ්‍රැත නොවීය. ඒ කියැවීම සමාජයේ ගැටෙමින් යටි තලයටම කිඳාබසිමින් තමන් ලැබූ අත්දැකීම් අනුව කළ ප්‍රායෝගික කියැවීමකි. "මෙල්බන් වෙසක් සිරි" වැඩ සටහනේ නියමුවන් හා උරෙනුර ගැටෙමින් කටයුතු කළ ජානක මෙල්බන් වෙසක් සිරි පෙරහැර සංවිධානය අරඹන්නේ හිමිදිරි පාන්දර හයට පමණ පාර්ලිමේන්තු දුම්රිය ස්ථානයේ බෞද්ධ කොඩියක් අතැතිව ඒ වෙනුවෙන් පැමිණෙන පිරිස පිලිගනිමිනි. එදින වැඩ නිමවන්නේ සියලු බඩු බාහිරාදිය වාහන වල පිටත් කොට අවසානයේ රාත්‍රී හයට හතට පමණය. 2500 අධික බෞද්ධ කොඩි වෙසක් කූඩු බෙදා දීමේදී ඔහුට වූ උනන්දුව ඔහුට අන්වර්ත නමක් පටබැඳීමට තරම් ප්‍රබල විය."

"ප්‍රජා ගුවන්විදුලි වැඩසටහනක් නම් එකී ප්‍රජාව තුළින් බිහිවන නිර්මාණ වලට නිසිතැන දිය යුතුය යන මතයේ තරයේ එල්බගත් තවත් එක් සහෘදයකු වූ ජානක බාලසූරිය මෙල්බන් ගායන හිතකාමීඋන් වෙතින් බිහිවූ ස්වතන්ත්‍ර නිර්මාණ වෙනුවෙන් පෙනී සිටියේ ය. එකී ගිත දර්ශකයක් සෙනසුරාදා වැඩ සටහනින් ප්‍රචාරය කරවීම ඔහු අප අතරින් වියෝ වන තුරුම දුටු සැබෑ නොවුණ සිහිනයයි. තමන් නියෝජනය කරන ගුවන්විදුලි සේවය මතු නොව අන් සියලු නාලිකා ශ්‍රවණය කරමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සිය අවසන්කාලය ගත කිරීමට අවසර ලබා දීමට ඔහුගේ රුදුරු දෛවය මදකට හෝ කාරුණික විය.

කැරොකේ ක්‍රමයට ගායනා කරනා ගී හිතකාමී එකමුතු වලට මුලදී ගායනයෙන් එක් වූ ජානක දෙවනුව එය සිය සිලුණ පුතුගේ වයලීන වාදන හැකියාව දැක්වීමට වේදිකාව කරගත්තේ ය. මෙහිදී ඔහු තෝරාගත්තේ ගී දැහැන" එකමුතුවයි. සිය පුතු අතට වයලීනයත් අලුවත් දී ශබ්දවාහිනී යන්ත්‍ර වලට සම්බන්ධ කොට ඔහු වහා සිය අසුනට දිව ගියේ සිය "පෙති" මෙවලමින් එකී වාදන දර්ශනගත කරගැනීමටයි. සිය පුතුගේ හැකියාවන් මතු නොව අන්‍යයන්ගේ ද හැකියාවන් ද නිර්ව්‍යාජව අගයමින් එවේලේම කාජගත කර ජංගම දුරකතන වලට එවීමට ජානක දැක්වූයේ මහත් උනන්දුවකි. මෙල්බන් කලා හිතකාමී පිරිසක් ගොනු කොට 3zzz ගුවන් විදුලියේ සිංහල අංශයේ අංගයක් ලෙස නිර්මාණය වූ "මෙල් ලංකා" කලා පදනමේ නියමුවන් අතරට සරු අදහස් එක්කරමින් දායක වූ ජානක අසනීප තත්ත්වයට පත් වන තුරුම ඒ සඳහා උනන්දු විය.

පන් පින් දෙන්නා ජානක බාලසූරිය මහත්තයාගේ අසනීප බලන්න යන අතරෙයි ආරංචි වුණේ ඒ මහත්තයා නැති වුණා ය කියලා. මේ දෙන්නා යනකොටත් උණුහුම ගියේ නැති දේහය ගෙදර.

"ජානක බාලසූරිය සහෘදයාගේ එක් බලාපොරොත්තුවක් සිලුණ පුතු බැව් සියලු දෙනා දැන සිටිය කාරණයක් විය. ඒ තමන්ගේ අවසන් කටයුතු කෙරෙන දවසක වයලීනයෙන් "අඩවන් වූ දෙනෙතින් ගලනා" ගීතය දේහය ඉදිරිපිට වයන ලෙසයි. ඩබ්ලිව් ඩී අමරදේවයන් ගැයූ මේ ගීය සිලුණ පුතුගේ වයලීන වාද්‍යාචාර්යවරයා වූ උපාලි පෙරේරා සංගීතතාචාර්යවරයා විසින් පුහුණු කරන ලදුව එකී ඉල්ලදීම ඉටු කෙරිණ"

ජානක මැකිලා යන්න ගියේ ය. ඒ ඔහුගේ දෙපුතුන් ලොවට අනගි සම්පත් ලෙස දායාද කරදෙමිනි. ඒ දෙපුතුන්ගේ මෙන්ම ජානකගේ බිරිඳ ද රැකගනිමින් ඔවුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් උපකාරවීම අප ප්‍රජාවේ යුතුකමක් මෙන්ම වලකීමක් ද වන්නේය. ජානක බාලසූරිය නිර්ව්‍යාජ නිහතමාණී සහෘදයා අපගේ ප්‍රජාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් නිහඬව වූ කැපවීම නිසා ය ඒ.

පන් ලියවිල්ල හමාර කළා.

